රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 06/2008

මගේ අංකය : ආ5/1/26-1
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07

2008.02.06

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## ජීවන වියදම් දීමනාව එකම පුද්ගලයකුට කිහිප ආකාරයකින් ගෙවීම ප්‍රතිශෝධනය කිරීම

2006.01.01 දින සිට රජයේ සේවකයන්ට සහ විශ්‍රාමිකයන්ට ජීවන වියදම් දීමනාව ගෙවීම සඳහා නිකුත් කරන ලද පහත සඳහන් චක්‍රලේඛවල විධිවිධාන යටතේ එකම පුද්ගලයාට රජයේ සේවකයකු වශයෙන්, වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ලාභියකු වශයෙන්, යැපෙන්නකු වශයෙන් සහ දුබලතා විශ්‍රාම වැටුප් ලාභියකු වශයෙන් කිහිප ආකාරයකට ජීවන වියදම් දීමනාව ලැබෙන බව වාර්තා වී ඇත.

(i) 2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2006 අනුව 2006.01.01 සිට රජයේ සේවකයන්ට සහ විශ්‍රාමිකයන්ට පිළිවෙලින් රු. 1000.00 සහ රු. 500.00.

(ii) 2006.08.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2006 අනුව 2006.07.01 සිට රජයේ සේවකයන්ට සහ විශ්‍රාමිකයන්ට පිළිවෙලින් රු. 1375.00 සහ රු. 687.50.

(iii) 2007.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2007 අනුව 2007.01.01 සිට රජයේ සේවකයන්ට සහ විශ්‍රාමිකයන්ට පිළිවෙලින් රු. 1750.00 සහ රු. 875.00.

(iv) 2007.07.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 17/2007 අනුව 2007.07.01 සිට රජයේ සේවකයන්ට සහ විශ්‍රාමිකයන්ට පිළිවෙලින් රු. 2125.00 සහ රු. 1062.50.

(v) 2008.01.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2008 අනුව, 2008.01.01 දින සිට රජයේ සේවකයන්ට සහ විශ්‍රාමිකයන්ට පිළිවෙලින් රු. 2500/- සහ රු. 1250/-.

(2008.07.01 දින සිට රජයේ සේවකයන්ට සහ විශ්‍රාමිකයන්ට පිළිවෙලින් රු. 2875/- සහ රු. 1437.50 වශයෙන් ගෙවීමට නියමිතව ඇත.)

02. මෙසේ එකම පුද්ගලයෙකුට කිහිප ආකාරයකින් ජීවන වියදම් දීමනාව ලැබෙන බව පැහැදිලිව පෙනී යන බැවින් කිසිම පුද්ගලයකුට රජයේ සේවකයකු වශයෙන් ලැබිය යුතු සම්පූර්ණ ජීවන වියදම් දීමනාව ඉක්මවා යන පරිදි ජීවන වියදම් දීමනාවක් හිමි නොවිය යුතුයැයි තීරණය කර ඇත.

03. ඉහත 02 වන ජේදයේ සඳහන් පරිදි තම වැටුප සමග ලැබෙන ජීවන වියදම් දීමනාවට අමතර වශයෙන් වෙනත් පදනමක් මතද ජීවන වියදම් දීමනාව ලබන සියලුම නිලධාරීන් වෙතින් මේ සමග ඇති ඇමුණුම I ආකෘතිය අනුව ප්‍රකාශයක් (දෙපිටපතකින් යුතුව) 2008.03.15 දිනට පෙර ලබාගැනීමට ආයතන ප්‍රධානීන් කටයුතු කළ යුතුය. අනතුරුව අදාල නිලධාරීන්ට වෙනත් පදනමක් මත ගෙවනු ලබන ජීවන වියදම් දීමනාවට සමාන මුදල; 2008.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔවුන්ගේ මාසික වැටුප සමඟ ගෙවනු ලබන ජීවන වියදම් දීමනාවෙන් අඩුකර ගෙවීමට ආයතන ප්‍රධානීන් විසින් පියවර ගත යුතුය. ඇමුණුම I හි ප්‍රකාශයේ පිටපතක් වෙනත් පදනමක් මත ජීවන වියදම් දීමනාව ගෙවනු ලබන බලධාරියා (විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රාදේශීය ලේකම්/ආයතන ප්‍රධානියා) වෙත යවා තහවුරු කර ගැනීමද කළ යුතුය.

04. මීට අතිරේක වශයෙන් සේවයෙන් ඉවත් වූ පසුවද එකම පුද්ගලයකු පහත සඳහන් තත්ත්වයන් මත "ජීවන වියදම් දීමනාව" අවස්ථා කිහිපයකදී ලබාගන්නා බව පෙනී ගොස් ඇත.

(අ) ත්‍රස්තවාදී හේතු මත ආබාධිත තත්ත්වයට පත්වන නිලධාරීන් අවුරුදු 55 දක්වා වැටුපද, ආබාධිත ස්වභාවය අනුව දුබලතා විශ්‍රාම වැටුපද, එමෙන්ම වසර 10 ක සේවා කාලය ඇති විට සේවා විශ්‍රාම වැටුප ද සමඟ ජීවන වියදම් දීමනාව ලැබීම.

(ආ) ත්‍රස්තවාදී හේතු මත හෝ සුනාමි ව්‍යසනය මත මියගිය නිලධාරීන්ගේ කලත්‍රයාට නිලධාරියාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වනතෙක් ලැබෙන වැටුපද, මියගිය දින සිට ලැබෙන වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුපද/වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුපද, යැපෙන්නන්ගේ දීමනාවද සමඟ ජීවන වියදම් දීමනාව ලැබීම.

(ඇ) අවිවාහක හමුද නිලධාරියකු මියගිය විට ඔහුගේ දෙමාපියන්ට, නිලධාරියාගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වනතෙක් ලැබෙන වැටුප සහ යැපෙන්නන්ගේ දීමනාව සමඟ ජීවන වියදම් දීමනාව ලැබීම.

(ඈ) රජයේ විශ්‍රාමිකයකු වශයෙන් ලැබෙන විශ්‍රාම වැටුපද, මියගිය කලත්‍රයා වෙනුවෙන් ලැබෙන වැන්දඹු අනන්දරු විශ්‍රාම වැටුප/වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප සමඟද ජීවන වියදම් දීමනාව ලැබීම.

05. මෙසේ ඉහත 04 වන ඡේදය යටතේ එකම පුද්ගලයෙකුට එකම කාලපරිච්ඡේදය වෙනුවෙන් රජයේ සේවකයෙකුට ලැබෙන සම්පූර්ණ ජීවන වියදම් දීමනාව ඉක්මවා ජීවන වියදම් දීමනාවක් නොලැබිය යුතුයයි තීරණය කර ඇත. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඇමුණුම II ආකෘතිය මගින් තොරතුරු ලබාගෙන 2008.04.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සේවකයකු වශයෙන් ලැබෙන හිමිකමට වැඩියෙන් ලැබෙන ජීවන වියදම් දීමනාව අඩු කිරීමට පියවර ගත යුතුය. එහෙත් කිසියම් පුද්ගලයකු විශ්‍රාම වැටුප සමඟ ජීවන වියදම් දීමනාව (සම්පූර්ණ ජීවන වියදම් දීමනාවෙන් අර්ධය) ලබන විට කලත්‍රයා මියයාමේ හේතුව මත වැන්දඹු/වැන්දඹු පුරුෂ අනන්දරු විශ්‍රාම වැටුප සමඟ ජීවන වියදම් දීමනාව (සම්පූර්ණ ජීවන වියදම් දීමනාවෙන් අර්ධය) ද ලැබීමට බාධාවක් නැත. ඊට හේතුව ඔහුට හිමිවන සම්පූර්ණ ජීවන වියදම් දීමනාව, රජයේ සේවකයකු වශයෙන් ලැබෙන ජීවන වියදම් දීමනාව ඉක්මවා නොයැමයි.

06. මේ පිළිබඳව වැඩිදුර පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් අමතන ලෙසද වැඩිදුරටත් දන්වමි.

07. මහා භාණ්ඩාගාරයේ උපදෙස් මත මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

ඇමුණුම 1

..................................................

..................................................

..................................................

## ජීවන වියදම් දීමනාව ගෙවීම

................................................................................................... අමාත්‍යාංශයේ/

........................................................ දෙපාර්තමේන්තුවේ ..............................................

වශයෙන් සේවය කරන මම මගේ වැටුප සමග මසකට රු. ........................ ක ජීවන වියදම් දීමනාවක් ලබමි.

02. ඊට අමතරව මගේ කලත්‍රයාගේ හිමිකම යටතේ;

වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප සමග මසකට රු. ......................... ක ජීවන වියදම් දීමනාවක්

සහ

..........................................................................................................................

වශයෙන් මසකට රු. ..................... ක ජීවන වියදම් දීමනාවක්

ලබන බව ප්‍රකාශ කර සිටිමි.

03. ඉහත 02 වැනි ජේදයට අදල දීමනා ගෙවනු ලබන ආයතන හා යොමු අංක මෙසේය.

| ආයතනය | යොමු අංකය |
| --- | --- |
| ................................................ | .............................................. |
| ................................................ | .............................................. |

අත්සන : ..........................................

නම හා තනතුර : ........................................

දිනය : ........................... ........................................

---

මගේ අංකය :

ඔබේ අංකය :

දිනය :

................................................

........................................................... අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව සහතික කරමි.

ප්‍රාදේශීය ලේකම්/ආයතන ප්‍රධානියා

දිනය : .........................